# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 488 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 20/03/2024<br>පැය 0740 | | |

**මාධ්‍ය නිවේදනය**

**වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. වෙඩිතබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමට සම්බන්ධ සැකකරුවෙකු හෙරොයින් සමඟ අත්අඩංගුවට - කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2024.03.19 වන දින දහවල් කාලයේදී ජාඇල පොලිස් වසමේ අපරාධ නිවාරණ රාජකාරි යෙදී සිටි කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරින් විසින් හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 25ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ජා ඇල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අත්අඩංගුවට ගත් සැකකරු සම්බන්ධව සිදුකළ වැඩිදුර විමර්ශනයේදී 2024.03.09 වන දින ජාඇල පොලිස් වසමේ බස්වත්ත ප්‍රදේශයේදී යතුරු පැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු විසින්වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමේ අපරාධය සඳහා සැකකරුවන් පැමිණි යතුරු පැදියේ පැදිකරු බවට අනාවරණය වී ඇත.

ජා ඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.03.20 වන අද දින අළුයම් කාලයේදී අඟුලාන පොලිස් වසමේ අඟුලාන දුම්රියපොල ආසන්නයේදී බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිළධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන අඟුලාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 52 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අඟුලාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. දුම්රියක ගැටී පුද්ගලයෙකු මියයාම - මාතර පොලිස් වසම.

2024.03.19 වන දින දහවල් කාලයේ මාතර පොලිස් වසමේ පිලදූව දුම්රිය ගුවන් පාලම අසලදී මාතර සිට බෙලිඅත්ත දක්වා ධාවනයවූ දුම්රියක පුද්ගලයෙකු ගැටී මියගොස් ඇති බවට මාතර පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 28ක්වූ අම්බලන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ ඇති අතර මාතර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**